**(හැඳින්වීම)**

අද සාමාන්‍ය සමයේ තිස් තුන්වන ඉරුදින යි. මෙම ජනවන්දනා වසරේ අවසානයට ක්‍රමයෙන් ළඟා වෙමින් පවතින අපට අද දින දේව වචනය මඟින් ක්‍රිස්තුන් වහන්සේගේ මහිමාන්විත දෙවන ආගමනය පිළිබඳව සිහිපත් කර දෙයි. තවද උන්වහන්සේ පවිත්‍ර කරනු ලබන්නන් එකම පූජාවකින් පරිපූර්ණතාවයට ගෙනා බව ප්‍රකාශ කරනු ලබයි.

එසේම එම දිනය පිළිබඳව හෝ පැය පිළිබඳව හෝ දෙවිපියාණන් වහන්සේ හැර කිසිවෙකුත් නොදන්නා බැවින්, සදාකාල නින්දාව සහ පිළිකුලට ලක් නොවන පිණිස, විශ්වාසයෙන් සහ බලාපොරොත්තුවෙන් යුතුව, නිරතුරුව සදාකාල ජීවනය උදෙසා දිරි වඩන්නට අප සැමට ආරාධනා කරයි. ඒ සඳහා අවැසි ශුද්ධාත්ම මඟ පෙන්වීම සහ පාපය පැරද වීමට අවැසි දිරිය ඉල්ලා, අපි සැම මෙම දිව්‍ය යාගයට බැතියෙන් සහභාගී වෙමු.

**(විශ්වාසිකයන්ගේ යැදුම්)**

පිළිතුර - ස්වාමිනී, අප කරන යාච්ඤා අසා වදාළ මැනව.

1. ආදර දෙව් පියාණනී, ස්වර්ගීය ජෙරුසෙලමට පිවිසෙන්නට නිරන්තරයෙන් දිරි වඩන, ශුද්ධ වූ සභා මාතාවගේ සියලු දූ පුතුන් ආසිරි ගන්වා , සිය පූජක, පැවිදි සහ ගිහි කැඳවීම මෙලොව තුළ නිසි ලෙස ඉටු කරන්නට ඔවුනට අවැසි ශුද්ධාත්ම මඟ පෙන්වීම නොමඳව දානය කරන පිණිස,

2. ආදර දෙව් පියාණනි, ක්‍රිස්තුන් වහන්සේගේ මහිමාන්විත දෙවන පැමිණීමේ දී සිතින් , වචනයෙන් සහ ක්‍රියාවෙන් නිදොස්ව සිටින්නට අපට හැකි වන පරිදි, සියලු දුර් පරීක්ෂාවෙන් සහ නපුරෙන් අප සැම රැකගන්නා පිණිස,

3. ආදර දෙව් පියාණනි, අභිනවයෙන් පත් වූ සියලු ජන නායකයන්ට සිය නායකත්වයේ නිසි දැක්ම සහ අව්‍යාජ කැපවීම තුළින් යහපත් ජන දිවියක් සහ තිරසාර දේශයක් ගොඩනගන්නට අවැසි මග පෙන්වීම සහ ප්‍රඥාව දානය කරන පිණිස,

4. ආදර දෙව් පියාණනි, අපගේ උරුමය සහ ඉරණම ඔබවහන්සේගේ හස්තයේ බව පිළිගනිමින්, යාච්ඤාව සහ දේව වචනය තුළ ආධ්‍යාත්මිකව වර්ධනය වන්නටද, ඇල්මැරුණු කිතුනු දිවි පෙවත යළි ජ්වලිතකමින් පුරවා ගන්නටද, අප මීසම් සංඝයේ සැම ශුද්ධාත්ම බලයෙන් පුරවාලන පිණිස,